වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 11 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය

(අ) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) සභාවට අයත් ලාස් 22 ප්‍රමාණයෙන් යුත් හින්දු සුසාන භූමි ඉඩම අනවසරයෙන් අල්ලා ගැනීම සහ ලාස් 60 ප්‍රමාණයෙන් යුත් රු.3,242,600 කට මිලටගත් වාලින්නුගායි ඉඩමේ අයිතියට අදාළ නඩු පසුගිය වසර 15 තිස්සේ දිස්ත්‍රික් උසාවියේ විසඳීමකින් තොරව පැවති බැව් නිරීක්ෂණය විය. එසේ වුවත්, මෙම කරුණු සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හෙළිරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) පසුගිය වසර 15කට පෙර පරිත්‍යාග වශයෙන් උතුරු පළාත් ප්‍රධාන ලේකම් විසින් නිකුත් කළ රු.191,000 ක් වටිනා ට්‍රැක්ටර් ට්‍රේලරයක් සභාවට අයිතිවී නොතිබුණි. කෙසේ වෙතත්, එහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල වාහන වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පරිත්‍යාග වශයෙන් සභාවට නිකුත් කරන ලද මෝටර් රෝලක සහ ලැප්ටොප් පරිගණක වටිනාකම් තක්සේරු කර පසුගිය වසර 02 සිට වසර 03 දක්වා වූ කාල පරිච්ඡේදයක් තුළ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොමැති බැවින් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල යන්ත්‍රෝපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි<br>මුදල් රෙගුලාසි 571 | 33,151 | තෙවර්ගයක කල් ඉකුත් තැන්පතු සම්බන්ධයෙන් සභාව පසුගිය වසර 02 සිට වසරක් දක්වාවූ කාල පරිච්ඡේදය තුළ අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ<br>2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 චක්‍රලේඛය | | සභා වාහන 05ක් සඳහා වසරක කාල පරිච්ඡේදයකදී ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.104,354 ක් 4% ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.88,725,538 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 14,028,700 | - | 15,105,496 | 17,254,352 | 2,887,000 | - | 1,791,166 | 5,901,887 |
| (ii) කුලී | 41,083,000 | - | 41,137,004 | 233,695 | 36,521,800 | - | 34,293,706 | 137,300 |
| (iii)බලපත්‍ර ගාස්තු | 6,293,000 | - | 8,305,231 | - | 12,310,000 | - | 20,000,881 | - |
| (iv)වෙනත් ආදායම් | 31,701,000 | - | 63,969,502 | 123,664,245 | 25,393,500 | - | 50,343,488 | 117,836,427 |
| එකතුව | 31,701,000 | - | 128,517,233 | 141,152,292 | 77,112,300 | - | 106,429,241 | 123,875,614 |

(ආ) වරිපනම් හා බදු සහ හිඟ මුදල් රැස්කිරීමේදී සභාව විසින් උපලේඛන නිකුත් කර නොතිබු බැවින් ඇස්තමේන්තු කළ ආදායම හා රැස්කළ ආදායම අතර වූ වෙනස්කම් මත හිඟ සමුච්චිත ආදායම නිශ්චය කර තිබු බැව් නිරීක්ෂණය විය.

2.2.2 වරිපනම් හා බදු
--------------------

එකතුව රු.10,926,696 ක්වූ හිඟ වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා පසුගිය වසර 01 සිට වසර 05 තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.3 කුලී
-----

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.92,090 හිඟ කුලී අයකර ගැනීම සඳහා පසුගිය වසර 05 ක කාල පරිච්ඡේදය තුළ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

(ආ) එකතුව රු.2,120,526 ක් වූ වෙළඳ පොළ බදු ගාස්තු අයකර ගැනීම සඳහා පසුගිය වර්ෂ 05 කට අධික කාලයක් තිස්සේ සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 මුද්දර ගාස්තු
-------------

2017 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වෙතින් රු.35,650,806 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 කාර්යසාධනය
-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වගන්තියට අනුව සභාව විසින් මහජන සෞඛ්‍ය, මහජන උපයෝගී සේවා සහ පොදු මංමාවත් පිළිබඳ සියලු කරුණු පාලනය කිරීම් හා පරිපාලනය, සාමාන්‍යයෙන් ජනතාවගේ සුබවිහරණය, පහසුකම්, සුහසාධනය සහ ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම පිළිබඳව හෙළිවු කරුණු පහත සඳහන් පරිදි විය.

(අ) අත්හැර දැමූ කාර්යයන්

---------------------------

කාර්යසාධන කටයුතු ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂවලදී රු.1,200,000 ක මුදලක් වැයකර තිබුණි. කෙසේවුවද, මේ දක්වාත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමෙන් තොරව එම කටයුතු අත්හැර දමා තිබුණි.

(ආ) බන්ධනාගාර ප්‍රතිසංස්කරණය පුනරුත්ථාපනය සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශ අරමුදල් යොදා ගනිමින් චුන්නාකම් කොන්තියාලාඩි ප්‍රදේශයේ සභා නියමය යටතේ අපවිත්‍ර ද්‍රව්‍ය බස්නා කාණු සැකසුම් මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු යාපනය දිස්ත්‍රික් ලේකම් විසින් 2016 සැප්තැම්බර් පටන් සිදුවෙනමින් තිබියදී, 2018 මාර්තු 13 දින අත්හිටුවා තිබුණි. කෙසේවුවද මේ දක්වාම අපවිත්‍ර ද්‍රව්‍ය බස්නා කාණු සැකසුමේ මධ්‍යස්ථානය ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබූ නිසා සභා බල ප්‍රදේශය තුළ අපවිත්‍ර ජල බස්නා කාණු සැකසුම් කටයුතු සිදුකළ නොහැකිව තිබුණි.

(ඇ) පුන්නලායිකඩ්ඩුවන් ක්‍රීඩා පිට්ටනි අංගනයක අඩි 407 දිගින් තාප්පයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේදී සලසන ලද රු.3,250,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.1,200,000 වටිනා අඩි 222 ක් දිගට අංගන තාප්පය ඉදිකර තිබුණි. කෙසේවුවත්, මහජනතාවගේ විරෝධය හේතුවෙන් ඉතිරි අංගන තාප්ප අඩි 185 ක ප්‍රමාණය ඉදිකිරීමට නොහැකිවී ඇති බැව් නිරීක්ෂණය විය.

3.2 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

සභාව විධිමත් පරිදි මානව සම්පත් බඳවා ගැනීම සහ යෙදවීම සිදුකර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව සම්පත් 13 ක් විසින් නිමකළයුතු කාර්යයන් පමාවී තිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

------------------------------

3.3.1 වත්කම් භාරදීමට අසමත්වීම

--------------------------------

පසුගිය වර්ෂ 15 ක් තිස්සේ සභාව විසින් භාවිතා කළ වාහන හයක් මේ දක්වා සභාවට අයත්ව නොතිබුණි.

3.3.2 නඩත්තු හා අලුත්වැඩියාවන් සිදු කිරීමට අසමත්වීම

-----------------------------------------------------

මරුදුනාමඩම් වෙළඳපොළ ගොඩනැගිල්ලේ ඉහළ මාලය ඉදිකිරීම සඳහා සවිකරන ලද යකඩ දඬු අනතුරුදායක අන්දමින් මල බැඳී තිබුණි. අවිධිමත්ව ඉදිකිරීම් සිදුකිරීම හේතුවෙන් පහල මාලයේ වහලයේ පිපිරීම් තිබූ බැව් තවදුරටත් දක්නට ලැබුණි. එනිසා වර්ෂා කාලයේදී කාන්දුවීම් සිදු වූ බැව් කඩ කාමර හිමිකරුවන් සභාවට දන්වා තිබුණි. කෙසේවුවත්, සභාව ඒ සම්බන්ධයෙන් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

--------------------------------

අයවැය පාලනය

-----------------

අයවැයගත ආදායම සහ තත්‍ය ආදායම අතර රු.53,204 සිට රු.32,337,579 හෙවත් සියයට 0.01 සිට සියයට 19 දක්වාත් අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර රු.01 සිට රු.13,488,922 හෙවත් සියයට 0.12 සිට සියයට 136 දක්වා පරාසයක විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ගිණුම්කරණය | මිණුම් පත්‍රිකා ලේඛනය, ඉඩම් විකුණුම් මත බදු ලේඛනය සහ වාහන ලොග් පොත් නඩත්තු කිරීමට අසමත් වීම. |